"බාලවයස් දැරියක සමග පෙම් සුව විඳි විවාහකයා යුදගනාවේදී පොලිසිය අල්ලා ගනී" යන සිරස්තලයෙන් යුතුව අරුණ පුවත්පතේ පළවූ ලිපියකි. මෙහි අන්තර්ගතය තුළ මෙම බාලවයස් දැරිය, සතියකට ඉහත දුරකථන ඇමැතුමක් ඔස්සේ හඳුනාගත් අදාළ සැකකරුගේ ඉල්ලීම පරිදි පැමිණි බවත්, එහිදී සැකකරු විසින් දැරියට ලිංගික අතවර කර ඇතැයි ප්‍රශ්න කිරීම් වලදී අනාවරණය වූ බවත් ලිපියේ අන්තර්ගතය තුළ දැක්වේ.

බාලවයස් දැරියක් හා ලිංගික හැසිරීම් සිදුකිරීම නීතිය යටතේ ලිංගික අපයෝජනයක් යටතට ගැනේ. එසේ නම් බාල අපරාධයක් "පෙම් සුව විඳීමක්" බවට අරුණ සිරස්තලය තුල ලඝු වී ඇත්තේ මන්ද? ඒ ඔස්සේ වක්‍රාකාරීව මෙවන් වැරදි සැහැල්ලුවට ලක් කිරීමක් සහ ඒ නයින් අනුබල දීමක් සිදු නොවන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස් මොනවාද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna**